අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය

அத்தியாவசியச் சேவைகள் ஆணையாளர் நாயகம் அலுவலகம்

Office of Commissioner General of Essential Services

මගේ අංකය / எனது இல / My No: අත්‍ය/සේවා/කොම/02 (01)

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.09.01

පොලිස්පති

සියලුම දිසාපතිවරුන්

සභාපති, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

ආහාර කොමසාරිස්

**<u>හදිසි අවස්ථා (අත්‍යාවශ්‍ය ආහාර සැපයුම)</u>**

මහජන ආරක්ෂක ආඥා පනතේ 5 වන වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමන් විසින් වී, සහල්, සීනි ඇතුළු අත්‍යවශ්‍ය ආහාර තොග සැඟවීම, බොඳාහැරීම, අඩපණ කිරීම, අධික මිළ ගණන් අයකිරීම හා මහජනතාව අපහසුතාවයට පත්කරන වෙළඳපල අක්‍රමිකතා ඇති කිරීම ආදි කටයුතු වැලක්වීම සඳහා සහ පාරිභෝගික ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් කටයුතු කිරීමට නියෝග නිකුත් කර ඇති බැවින්, රජයේ සහතික මිළට හෝ රේගුවේදි ආනයනය කල මිළ ගණන් පදනම් කර ගෙන එසේ නීත්‍යානුකූල නොවන ලෙස රැස්කරගෙන ඇති වී, සහල්, සීනි ඇතුළු අත්‍යවශ්‍ය ආහාර තොග මිළදී ගෙන ජනතාවට සාධාරණ මිළට ලබාදීමට කටයුතු කරන ලෙසත්, එක් එක් දිස්ත්‍රික්කයේ අවශ්‍ය මැදිහත්වීම් සිදු කර මා වෙත නිරන්තරයෙන් වාර්ථා කරන ලෙසත් මෙයින් නියෝග කරමි.

**එන්ඩීඑස්පී නිවුන්හැල්ල ආර්ඩබ්පී ආර්එස්පී**
**මේජර් ජෙනරාල්**
**අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්**

පිටපත් : ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
ලේකම්, මුදල් අමාත්‍යාංශය
ලේකම්, වෙළඳ අමාත්‍යාංශය
ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය
ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
ලේකම්, සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව